<u>කොළඹ අංක 01 දිසා අධිකරණයේ දී ය.</u>

<u>දිසා විනිසුරු ආර්.ජී.රණරාජා මැතිතුමා ඉදිරිපිට දී ය.</u>

<u>නඩු අංකය:217/CO</u> **<u>2012.12.14</u>**

වාර්තා කලේ: නන්දනී ශ්‍රියාලතා.

## <u>නියෝගය</u>

පෙත්සම්කරු 2006.11.17 දින දාතමින් පෙත්සමක් දිවුරුම් ප්‍රකාශයක් සමඟ "හොටේල් ඩිවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම ඈවර කිරීම යුක්තිසහගත සහ සාධාරණ යන හේතු සාධකය මත එය ඈවර කිරීමට" නියෝගයක් අධිකරණයෙන් අයැද ගොනු කර ඇත.

පෙත්සම්කරු අදාළ අයැදීම, ඈවර කිරීමට නියෝගයක් අයැද සිටින සමාගමේ රුපියල් 10/= බැගින් වූ කොටස් 70,000 ක් දරණ කොටස් හිමි දායකයෙකු ලෙසට ඉදිරිපත් කර ඇත.

පෙත්සම්කරුගේ 2006.11.17 දින දරණ පෙත්සමෙහි අයැදීමට අදාළ විමසීම පවත්වාගෙන යන විට ඈවර කිරීමට යෝජිත සමාගම වන දැන් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පී.ඇල්.සී. යනුවෙන් හඳුන්වනු ලබන හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්හී නීතිඥ තැන 2012.03.15 දින දාතමින් මෝසමක් ගොනු කරමින්

21 DEC 2012

"මෙම නඩුව 2012.02.16 වන දින මෙම ගරු අධිකරණය ඉදිරියේ අඩගැසූ අවස්ථාවේ දී මෙම ගරු අධිකරණයේ ගරු විනිශ්චයකාර තුමන් විසින් මැදිහත්කාර වගඋත්තරකරුගේ ඉල්ලීම ලිඛිතව ඉදිරිපත් කිරීමට 2012.03.15 දින කැඳවීමට නියෝග කරන ලදී. එම නියෝගය ප්‍රකාරව මැදිහත්කාර වගඋත්තරකරු වෙනුවෙන් පහත සඳහන් කරුණු සැළ කර සිටි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් 2011 අංක 43 දරණ ඌන ක්‍රියාකාරී ව්‍යවසහයන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනතේ 1 වන උපලේඛනයේ අංක 1 යටතේ හොටෙල් ඩිවලපර්ස් (ලංකා) ලිමටඩ් සමාගම නම් කර ඇති අතර, එම සමාගමේ වත්කම් සහ කොටස් එකී පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව මෙම පනත ක්‍රියාත්මක වන 2011.11.11 දින සිට රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම් වරයා සතු වන්නේ ය.

තවද, එකී පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව කැබිනට් මණ්ඩලය විසින් (කැබිනට් තීරණ අංක 11/2181/504/132-II මත) ඉහත කී හොටෙල් ඩිවලපර්ස් (ලංකා) ලිමටඩ් සමාගම සම්බන්ධයෙන් වූ නිසි බලධාරියා ලෙස ජනාධිපති නීතිඥ සේනක වල්ගම්පාය මහතා පත් කර ඇත.

ඒ අනුව මෙම නඩුවේ පෙත්සම්කරු හා අනෙක් පාර්ශවකරුවන්ට අයත් සියලුම කොටස් හා වත්කම් එකී පනතේ 3 වන වගන්තිය ක්‍රියාත්මක වීම තුළින් නිසි බලධරයා වෙත දැනටමත් පැවරී ඇති බව ඉතාමත් ගෞරවයෙන් සැළ කර සිටි.

මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට හෝ මෙම නඩුවට අදාළ හොටේල් ඩිවලොපර්ස් (ලංකා) ලිමටඩ් සමාගම ගණන් බේරා වසා දැමීමට මෙම ගරු අධිකරණය විසින් නියෝග කලහොත්, 2011 අංක 43 දරණ ඌන ක්‍රියාකාරී

21 DEC 2012

ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනතේ ප්‍රකාශිතවම සඳහන් වන ප්‍රතිපාදනයන් හා එකී පනතේ පරමාර්ථයන්ට පටහැනිව කටයුතු කිරීමක් වන බවද තවදුරටත් ගෞරවයෙන් සැළ කර සිටි.

තවදුරටත් මැදිහත්කාර වගඋත්තරකරු වෙනුවෙන් ගෞරවයෙන් සැළ කර සිටින්නේ,

(අ) 2011 අංක 43 දරණ පනත ක්‍රියාත්මක වීම මත පෙත්සම්කරු තවදුරටත් කොටස් හිමයෙකු නොවන බවත්,

(ආ) මෙම නඩුව මෙම අධිකරණය ඉදිරියේ පවත්වාගෙන යාමට පෙත්සම්කරුට නෛතික පදනමක් නොමැති බවත්,

(ඇ) පෙත්සම්කරුගේ නඩුව මෙම කරුණු මතම නිෂ්ප්‍රභා විය යුතු බවත් ය." ලෙසට කරුණු දක්වා ඇත.

එම කාරණාව මතම පිහිටා මැදිහත්වන පාර්ශවයක් වන මුදල් අමාත්‍යාංශයේ ලේකම් ද 2012.03.15 දින දාතමින් මෝසමක් ගොනු කර ඇත.

මෝසම් 2 හි අයදීමට අදාළ විමසීම පාර්ශවයන් ලිඛිත දේශණ ගොනු කරමින් අවසන් කරගෙන ඇත.

**Company Law in Sri Lanka – Arritta R.Wikramanayake** - ග්‍රන්ථයේ 360 පිටුවේ 2007 අංක 7 දරණ සමාගම් පනතේ 532(1) වගන්තියෙහි අන්තර්ගතය සාකච්ඡාවට භාජනය කර ඇත. අදාළ කාරණාව,

21 DEC 2012

**"The provisions of the Act will not apply to winding up proceedings that have commenced before the appointed date. Such proceedings will continue in the same manner and with the same incidents as if the Act had not been enacted, and under the law which was in force at the time the proceedings were commenced."** ලෙසට සාකච්ඡාවට භාජනය කර ඇත.

පෙත්සම්කරු විසින් නඩුවට අදාළ පෙත්සම 2006.11.17 දින ගොනු කර ඇත. ඒ හරහා හොටෙල් ඩිවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම ඈවර කිරීමට නියෝගයක් අයැද ඇත. එම අයදුම 1982 අංක 17 දරණ සමාගම් පනතේ විධාන පරිදි ඉදිරිපත් කර ඇත. **Company Law in Sri Lanka** ග්‍රන්ථයේ උපුටා දක්වා ඇති පරිදි කරුණු ඇතුළත් වූ කල පෙත්සම්කරුගේ 'ඈවර කිරීමේ නියෝග' අයදීමට 1982 අංක 17 දරණ සමාගම් පනතේ විධාන අදාළ වේ.

1982 අංක 17 දරණ පනතේ 257(1) වගන්තියේ,

**"257.(1) An application to the court for the winding up of a company shall be by petition, presented subject to the provisions of this section either by the company, or by any creditor or creditors (including any contingent or prospective creditor or creditors), contributory or contributories, or by all or any of those parties, jointly or separately;"**

21 DEC 2012

ලෙසට සමාගම ඇවර කිරීමට කොටස් හිමි දායකයකුට පෙත්සමක් ගොනු කරමින් අයැද සිටීමට ප්‍රතිපාදන සපයා ඇත. 248, 249 වගන්තීන්හි සමාගමක් ඇවර කිරීමේ දී කොටස් හිමි දායකයකුගේ බැරකම් කවරේද, කොටස් හිමි දායකයකු කවරෙක් ද යන්න පිළිබඳව විස්තර/විධාන/අර්ථ නිරූපනයන් ඇතුළත් වේ.

249 වගන්තියේ දායකයකු යන්න,

"249. **In this Part the expression "contributory" means every person liable to contribute to the assets of a company in the event of its being wound up, and for the purposes of all proceedings for determining, and all proceedings prior to the final determination of, the persons who are to be deemed contributories, includes any person alleged to be a contributory."** ලෙසට අර්ථ නිරූපනය කර දක්වා ඇත.

එවිට පෙත්සම්කරු ඇවර කිරීමට අයැද සිටින සමාගමේ කොටස් හිමිකරුවෙකු වීම මත හා එය ඇවර කිරීමේදී කොටස් හිමියකු ලෙසට බැරකම් සම්බන්ධයෙන් දායක වීමට බැඳී සිටීම මත දායකයකු ලෙසට ඉදිරිපත්වී ඇති බවට නිගමනය කළ හැක.

**Revival of Underperforming Enterprises and Underutilized Assets Act No. 43 of 2011** ලෙසට පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරගෙන ඇත. එම පනතේ 2(1) වගන්තිය එහි 1 උපලේඛණය සමඟ සැළකිල්ලට ගත්විට ඇවර කිරීමට යෝජිත සමාගම

21 DEC 2012

Underperforming Enterprise එකක් ලෙසට හඳුනාගෙන ඇත. ඒ අනුව ඈවර කිරීමට යෝජිත සමාගමේ කොටස් භාණ්ඩාගාර ලේකම් වෙත පැවරී ඇත. එසේ භාණ්ඩාගාර ලේකම් වෙත ඈවර කිරීමට යෝජිත සමාගමේ කොටස් අදාළ පනත ක්‍රියාත්මක වූ දින වන 2011.11.11 දින සිට පැවරී ඇත.

එවිට පෙත්සම්කරුට තවදුරටත් ඈවර කිරීමට යෝජිත සමාගමේ කොටස් හිමි වන්නේ නැත. කොටස් හිමි නොවීම මත එහි කොටස් හිමියකු ලෙසට ඈවර කිරීමේ දී බැරකම් සම්බන්ධයෙන් දායක වීමට බැඳෙන්නේ නැත. එවිට තවදුරටත් පෙත්සම්කරු නඩුවේ කාර්යයන් සඳහා දායකයකු ලෙසට නිගමනය කර ඒ මත පිහිටා කටයුතු කළ නොහැක.

ඈවර කිරීමට යෝජිත සමාගම වෙනුවෙන් ලිඛිත දේශණ ගොනු කරමින්,

> **"Some of the Respondents have taken up the position that the relevant date for the determination of status/*Locus standi* is the date of institution of proceedings, that is *litis contestation.***

**i) the principle of *Litis Contestatio* is applicable ONLY in adversarial litigation, where party A files action against party B, based upon a cause of action as contemplated by the Civil Procedure Code.**

21 DEC 2012

ii) However it is submitted that winding up proceedings are not based upon a cause of action but are special *sui generis* proceedings which are not adversarial, whereby the Petitioner invokes the jurisdiction of Court to wind up a company. Winding up proceedings are in fact between the Petitioner and the winding up Court and are not adversarial. Accordingly the principle of *litis contestatio* would not apply.

iii) In any event, in several special types of proceedings including *Rei Vindicatio* actions and actions for Winding up it has been specifically held that the Plaintiff/Petitioner MUST retain the character in which he invokes the jurisdiction of Court, right until the end of such proceedings in order to obtain relief by Court."

<u>Winding up proceedings</u>

It is well established that in proceedings for winding up the Petitioner must maintain the character in which he filed the application right through out. For the purpose of brevity the principle as enunciated in *Palmer's Company Law (24th edition)* in dealing with just and equitable winding up in England and Wales is set out for the consideration of Court.

Page 1373 – paragraph 88-89 – the first sentence on the page

21 DEC 2017

**In considering whether it is just and equitable to wind up a company, the court must have regard to the facts existing at the time of the bearing of the petition, and not to those existing at the time the petition was presented."** ලෙසට කරුණු දක්වා ඇත.

එසේ දක්වා ඇති කාරණාවන් සම්බන්ධයෙන් මෙම අධිකරණය සැහීමට පත්ව ඒ මත පිහිටා නියෝගය නිකුත් කිරීමේදී කටයුතු කරනු ලැබේ.

නියෝගය නිකුත් කිරීමට හේතුකාරක වූ අයැදීම් මෝසම් මගින් ඉදිරිපත් කිරීම මත ඒවා සිවිල් නඩුවිධාන පනතේ 375 වගන්තියෙහි විධානයන්ට පටහැනිව සිදු කර ඇති බවට කරුණු ඉදිරිපත් කර ඇත. නඩුවක ආනුෂංගික ඉල්ලීමක් කරන්නේ නම් එය පෙත්සමක් හා දිවුරුම් ප්‍රකාශයක් මගින් සිදු කළ යුතු බවට කරුණු දක්වා ඇත. අදාළ අයදුම් එසේ සිදු නොකිරීම මත ඒවා මුල පටන්ම නිෂ්ප්‍රභා කළ යුතු බවට කරුණු දක්වා ඇත.

**Edirisinghe Vs. Wimalawardane and another 2002 [3] SLR** ............ පිටුවේ වාර්තා කර ඇති නඩුවේ තීන්දුව **Balapatabendi** විනිසුරු තුමා ප්‍රකාශයට පත්කරමින්,

**"The object of civil procedure is to prevent civil proceedings from being frustrated by any kind of technical irregularity, or lapse which has not caused prejudice or harm to a party. (vide the decision of Distilleries Co., Ltd. V. Kariyawasam)**

21 DEC 2012

in the same case Nanayakkara, J. said that:

As Chief Justice Abraham remarked in the case of Velupillai V.The Chairman, District Council Jaffna that "the Court of law is a Court of Justice and it is not an academy of law should be always uppermost in one's mind. The court should not approach the task of interpretation of a provision of law with excessive formalism and technicality. The Code of Civil Procedure provides a series of rules designed to facilitate the orderly and impartial conduct from the stage of drafting of the pleadings until the judgment and execution of decree. Therefore, the rules of procedure have been designed and formulated to facilitate due administration of justice." ලෙසට වෙනත් දේ අතර කරුණු සාකච්ඡා කර ඇත.

එසේ කරුණු සාකච්ඡා කර තිබීමට සාපේක්ෂව මෙම විමසීමට හේතු වූ අයදුම් දෝෂ සහිත ආකාරයට ඉදිරිපත් කර ඇති බවට කරුණු දක්වා තිබීම සැළකිල්ලට ගනු ලැබේ. අදාළ අයදීම් මෝසමක් මගින් ඉදිරිපත් කර තිබීම මත පෙත්සම්කරුට අගතියක් සිදුවන බවට කරුණු තහවුරු වී නැත. ඒ අනුව මූලික විරෝධතාව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පෙත්සම්කරුට තවදුරටත් ඇවර කිරීමට අයැද සිටින සමාගමේ කොටස් හිමි නොවීම මත එය ඇවර කිරීමේදී පෙත්සම්කරු කොටස් හිමි දායකයකු ලෙස සළකා කටයුතු කළ නොහැක. කොටස්

21 DEC 2012

හිමි දායකයකු නොවීම මත පෙත්සම්කරුට නඩුව තවදුරටත් පවරා පවත්වාගෙන යාමට හිමිකමක් නැත.

කරුණු එසේ වූ කළ පෙත්සම්කරුගේ 2006.11.17 දින දරණ පෙත්සම නිෂ්ප්‍රභා කරමින් නියෝගයක් නිකුත් කරනු ලැබේ.

අ/කලේ,

(ආර්.ඒ.රණරාජා)

දිසා විනිසුරු - කොළඹ.

2012.12.14

ඉහත පිටු අංක 01 - 10 දක්වා සඳහන් වනුයේ කොළඹ දිසා අධිකරණයේ අංක 217/CO දරණ නඩු වාර්තාවට ගොනු කොට ඇති 2012.12.14 දිනැති නියෝගයේ සත්‍ය පිටපතක් බවට මෙයින් සහතික කරමි.

සකස් කලේ:-

පරීක්ෂා කලේ:-

රෙජිස්ට්‍රාර්.

අතිරේක රෙජිස්ට්‍රාර්

දිසා අධිකරණය

කොළඹ

12/12/21

21 DEC 2012